www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා හමුදාවෝ අවසන් ප්‍රහාරය දියත් කරද්දී සිවිල් වැසියන් සිය ගනනක් මරු දකී

## Hundreds dead as Sri Lankan army launches final assault

**කේ රත්නායක විසිනි**

**2009 අප්‍රේල් 22**

ශ්‍රී ලංකා මිලිටරිය දිවයිනේ උතුරෙහි එල්ටීටීඊ අත පැවති අවසාන කුඩා බිම් තීරුව අල්ලා ගැනීමේ ප්‍රහාරය දියත් කර තිබේ. ආන්ඩුවේ ප්‍රකාශිත "යුද මුක්ත" කලාපය තුල තවමත් සිරවී සිටිතැයි සලකනු ලබන ලක්ෂයක සිවිල් ජනතාව ගැටුම්වලට මැදිවීමත් සමග මානව ව්‍යසනයක් පිලිබඳව ආධාර ආයතන අනතුරු අඟවයි.

එක්සත් ජාතීන්, මහා බලවතුන් හා ජාත්‍යන්තර සංවිධාන විසින් සටන් නතර කිරීමට කල ඉල්ලීම් බැහැර කල ආන්ඩුව නරුම ලෙස කියා සිටින්නේ ප්‍රහාරය වනාහි සිවිල් ජනතාව ගලවා ගැනීමෙහිලා ලෝකයේ "දැවැන්තම මුදාගැනීමේ මෙහෙයුම" බවයි. සැබෑව නම්, සිදුවෙමින් පවතින්නේ පසුගිය දෙදින තුල පමනක් සිවිල් වැසියන් සිය ගනනකට මරු කැඳවූ යුද අපරාධයකි.

හමුදාව එල්ටීටීඊයේ නැගෙනහිර ආරක්ෂක වැටි බිඳ දැමීමෙන් පසුව එහි පාලනයේ පැවති ප්‍රදේශයෙන් පලායන වැසියන්ගේ දිගු පෝලිම් ආන්ඩුවේ ප්‍රචාරක මාධ්‍යයන් තුලින් පෙන්වනු ලැබිනි. පසුගිය දෙදින තුල සිවිල් වැසියන් 62,000 වැඩි සංඛ්‍යාවක් "මුදාගත්" බව ප්‍රකාශ කල හමුදාව කොලඹ රූපවාහිනී නාලිකාවන් වෙත වීඩියෝ පට නිකුත් කලේය. ජනාධිපති මහින්ද රාජපක්ෂ කියා සිටියේ මෙම පිටමංවීම "1989 නොවැම්බරයේ බර්ලින් තාප්පය බිඳවැටීමට නොඅඩු විමුක්තිය සඳහා වූ දැවැන්ත ජනවරමක්" බවයි.

ආන්ඩුව සියලු ස්වාධීන මාධ්‍ය වාර්තාකරනය හා ආධාර ආයතන බොහොමයකට යුද කලාපය තහනම් කර ඇති තත්වය තුල සංඛ්‍යාවන් තහවුරු කර ගැනීමට හැකියාවක් ඇත්තේ නැත. ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ ප්‍රකාශිකාව වන සරසි විජේරත්න මාධ්‍ය ආයතන වෙත ප්‍රකාශ කලේ ඇගේ සංවිධානයේ සංඛ්‍යා ආන්ඩුවේ සංඛ්‍යාවන්ට වඩා බොහෝ අඩු බවය. සඳුදා දිනය තුල 11,000 ද අඟහරුවාදා 5,000 ද යුද පෙරමුන හරහා ගමන්ගත් බව ඇය කියා සිටියාය.

ආන්ඩුවේ ක්‍රියා පිලිවෙත ගැන ජාත්‍යන්තරව එල්ල වන විවේචන මගහැරීම සඳහාත් සිය අපරාධ පිලිබඳව රටේ අනෙකුත් ප්‍රදේශවල වැඩකරන ජනතාව අඳුරේ තැබීම සඳහාත් පිටමංවන ජනතාවගේ ප්‍රමානය අතිශයෝක්තියට නැඟීමට ආන්ඩුවට සෑම අතකින්ම අවශ්‍යව තිබේ. ජනතාව "මිනිස් පලිහක්" ලෙස යොදාගන්නා බවට එල්ටීටීඊයට චෝදනා කරන රාජපක්ෂ අනෙක් අතට, කොටුවී සිටින ජනතාව සාපරාධී ලෙස නොතකා හරිමින් "පූර්න ජයග්‍රහනය" අත්කර ගැනීමට යුද මුක්ත කලාපයට කඩාවදින ලෙස හමුදාවට අන කරයි. ආධාර ආයතන නිසැකව ම එල්ටීටීඊයේ එම භූමි භාගයෙන් ජනතාව ඉවත්ව යාම වැලැක්වීමේ යෙදී සිටින අවස්ථා පිලිබඳව වාර්තා කර තිබෙන අතර, මිනිසුන් පලා යන ප්‍රධාන හේතුව යුද මුක්ත කලාපයේ පවතින ඛේදජනක තත්වයයි. මිලිටරිය සහන සැපයුම් වලක්වනු ලැබීමේ හෙතුවෙන් දස දහස් සංඛ්‍යාත මිනිසුන් ප්‍රමානවත් ආහාර, බෙහෙත් හා නවාතැන් නොමැති කමෙන් පීඩාවට පත්ව සිටිති. මිනිසුන් පලායාමේ තත්වයක් නිර්මානය කිරීම සඳහා මිලිටරිය නිරන්තරව හා ඉවක් බවක් නොමැතිව එම ප්‍රදේශයට කාලතුවක්කු වෙඩි මුර එල්ල කරයි.

රතු කුරුස සංවිධානයේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ පියෙරි ක්‍රහෙන්බෝල් 21 දින වර්තමාන තත්වය විස්තර කලේ "ව්‍යසනයකට කිසිසේත්ම නොඅඩු" ලෙසටය. "දැනට ජනතාවගේ මූලික අවශ්‍යතාවක් කිසිවක් ඉටු නොවන අතර සෞඛ්‍ය පහසුකම් හිඟය නිසා දිනෙන් දින මරන සංඛ්‍යාව ඉහලයාමේ ද වසංගත හා දුෂ් පෝෂනය පැතිරයාමේ ද ඉඩ කඩ බෙහෙවින් වැඩිවී ඇතැයි" ඔහු වැඩිදුරටත් කියා සිටියේය.

"හදිසි ප්‍රතිකාර අවශ්‍යව ඇති දහසකට අධික තුවාලකරුවන් සංඛ්‍යාවක් සටන් බිමෙන් ඉවත්කර ගත යුතු බව අපි විශ්වාස කරන්නෙමු. ප්‍රදේශය තුල එල්ටීටීඊ සටන්කරුවන්ට එරෙහි ආන්ඩුවේ අවසන් හමුදා ප්‍රහාර හේතු කොට ගෙන සිවිල් වැසියන්ගේ මරන සංඛ්‍යාව නාටකාකාර ලෙස ඉහල යනු ඇතැයි අපි කනස්සල්ලට පත්ව සිටින්නෙමු"

බෝට්ටු මාර්ගයෙන් සීමිත ඖෂධ හා ආහාර සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙස යොදාගෙන තිබුනු පුදුමාතලන් ගම්මානය සඳහා වනවිට හමුදාව විසින් අල්ලාගැනීමෙන් පසුව තත්වය තවත් නරක අතට හැරී ඇති බව රතු කුරුස සංවිධානය සඳහන් කරයි. ගම්මානයේ තාවකාලික රෝහල වසා දමා ඇත. "එහි කිසිදු වෛද්‍ය පහසුකමක් ඇත්තේ නැත. සිවිල් වැසියන් ආරක්ෂා කරන ලෙස අප දෙපාර්ශවයටම කියා සිටින නමුත් මේ දක්වා එය ඉටුවී නැත." එහි ප්‍රකාශක සිමොන් ස්කෝනෝ එසේ පැවසීය.

සිවිල් මරන ඉහල යමින් තිබේ. මේ වසර තුල පමනක් අඩුම තරමින් පුද්ගලයන් 4,500 මියගොස් 12,000 පමන තුවාල ලබා ඇති බව එක්සත් ජාතීන්ගේ වාර්තාවල සඳහන් වෙයි. එක්සත් ජනපදය පදනම් කර ගත් හියුමන් රයිට්ස් වොච් සංවිධානය පසුගිය මාසයේ වාර්තා කලේ මෙම වසර තුල යුද මුක්ත කලාපයෙහි මියගිය සිවිල් වැසියන් සංඛ්‍යාව අඩුම තරමින් 2,700 බවය. පසුගිය දෙදින තුල ෂෙල් වෙඩි ප්‍රහාරවලින් පුද්ගලයන් දහසක් මියගොස් 2,300 තුවාල ලබා ඇති බව එල්ටීටීඊය ප්‍රකාශ කරයි. පසුබිමෙන් නැගෙන පිපිරුම් හඬ මධ්‍යයේ බීබීසී සමග දුරකථනයෙන් කථා කල එල්ටීටීඊ ප්‍රකාශක තිලීපන් පැවසුවේ මිනිසුන්ට තාවකාලික බංකර්වල දැව කඳන් යට සැගවීමට බලකෙරෙමින් හමුදාව රෝහලටත් ලමා සුරැකුම් මධ්‍යස්ථානයකට හා නිවාස රාශියකටත් පහර දුන් බවය.

යුද මුක්ත කලාපයේ කොටුවී සිටින සිය මමා සමග කෙටි දුරකථන සංවාදයක යෙදුනු ඒසන් කදීසන් නමැත්තා 21 දින ඕස්ට්‍රේලියානු ගුවන් විදුලි සංස්ථාව වෙත මෙසේ පැවසීය: "ඔහු කෑගසමින් හා හඬමින් කියා සිටියේ තමන් යන යන තැන මලසිරුරු වැටී ඇති බවත් ඉන් වැඩි දෙනා ලමයින් බව හා එදින බොහෝ මිනිසුන් මිය ගිය බවත්ය."

යුද මුක්ත කලාපයෙන් පලායන බෙහොමයක් තුවාලකරුවන්ය. මෙඩිසින් සැන්ස් ෆ්‍රන්ටියර්ස් (එම්එස්එෆ්) වව්නියාව රෝහලේ ඛේදනීය තත්වය ගැන 21 දින වාර්තා කලාය. පසුගිය පැය 36 තුල රෝහලට පුද්ගලයන් 400 ඇතුලත් කල අතර එය පසුගිය සතියේ සංඛ්‍යාව මෙන් දෙගුනයක් පමනය. "බස්රථ තවමත් ලගාවෙමින් තිබේ. සමහර තුවාලකරුවන් අතරමගදී මියයෑම නිසා ඔවුන් සමහර විට ගොඩබාන්නේ මලමිනීය." එසේ පැවසුවේ එම්එස්එෆ් හි කරේන් ස්ටුවර්ට් නමැති නිලධාරියාය.

ඔහු තව දුරටත් මෙසේ පැහැදිලි කලේය: "මා කථාකල මිනිසුන්ගෙන් සියයට 85 පමන, හදිසියේ ම පතිතවූ ෂෙල් වෙඩි ප්‍රහාරයකින් පසුව බංකර් තුල සැගවී ගත් පුද්ගලයන් ගෙන් අඩක් පමන මියගොස් සිටිබව ඇසින් දුටුවන් හා එවන් බිහිසුනු සිද්ධීන් අත්දුටු අයයි. තමන් වතුර ටිකක් සොයා ගැනීමට ගොස් ආපසු පැමිනෙන විට බංකරය තුල සිටි සියල්ලන් මියගොස් සිටි ආකාරය මා සමග කථාකල එක් තැනැත්තියක් පැවසුවාය."

කොටුවී සිටින වැසියන් පිලිබඳ ආන්ඩුවේ ප්‍රකාශිත කනස්සල්ලේ තරම යුද මුක්ත කලාපයෙන් පලායන්නවුන් ගාල්කර ඇති ආකාරයෙන් පෙනී යයි. සරනාගතයන් ලෙස ඔවුන්ට සැලකීම කෙසේ වෙතත්, මිලිටරිය විසින් රැකවල් ලා ඇති කටුකම්බි වලින් වටකල සිර කඳවුරු තුලට ගාල්කර සිටින ඔවුන්ට සලකන්නේ සතුරන් ලෙසට ය. එම්එස්එෆ් අනුව වව්නියාව අසල රැඳවුම් මධ්‍යස්ථාන දැන් පිරී ඉතිරී යමින් තිබේ. "සමහර තැන්වල මුලු පවුලක්ම රැඳී සිටින්නේ සෝපාවක තරම් කුඩා ඉඩක ය.

හමුදාවේ ආසන්න ජයග්‍රහනය පිලිබඳව ජනාධිපති රාජපක්ෂ, ආන්ඩුවේ ඇමතිවරු හා කොලඹ ජනමාධ්‍ය ජයඝෝෂා නැංවීමේ වාතාවරනයක් නිර්මානය කිරීමේ උත්සාහයක නියැලී සිටිති. හමුදාව යුද මුක්ත කලාපය බිඳහෙලනු දැක්වෙන වීඩියෝ පට නැරඹීමට රාජපක්ෂ 21 සඳුදා කොලඹ ගුවන් හමුදා මූලස්ථානයට පැමිනියේය. "එල්ටීටීඊය පූර්න ලෙස පරාජය කිරීමේ ක්‍රියාවලිය මේ දැන් ඇරඹී ඇතැයි" ඔහු ජයග්‍රාහී ලෙස ප්‍රකාශ කලේය. "දැන් කොටින්ට සියල්ලම අවසන්වී තිබේ."

එල්ටීටීඊය කොන්දේසි විරහිතව යටත්වීමට සඳුදා මධ්‍යාහ්නයේ සිට පැය 24 කාලයක් නියම කරමින් ආන්ඩුව, සිය අවසන් ප්‍රහාරය පෙරට ගෙන යමින් සිටියි. එය දෙදිනක සටන් අත්හිටුවීමක් දක්වා දීර්ඝ කරන ලෙසට බ්‍රිතාන්‍ය අගමැති ගෝර්ඩන් බ්‍රවුන් කල ඉල්ලීම රාජපක්ෂ විසින් ඉවත දැමීය. ජනතාවගේ දුක් වේදනා පිලිබඳ නිල පසම්තුරුකම පෙන්නුම් කරමින් අගමැති රත්නසිරි වික්‍රමනායක එවන් ජාත්‍යන්තර ඉල්ලීම් එල්ටීටීඊය රැකගැනීමට සැලසුම් කල "මහා විහිලුවක්" ලෙස සමච්චලයට ලක් කලේය.

එක්සත් ජනපදය බ්‍රිතාන්‍ය හා අනෙකුත් මහා බලවතුන් "මානුෂික විරාමයක්" සඳහා කරන බලපෑම්, සිරවී සිටින දහස් ගනනක් ජනතාව ගැන අනුකම්පාවෙන් කරන දේ නොවේ. දෙවසරකට වැඩි කාලයක් තිස්සේ මෙම ආන්ඩු, ශ්‍රී ලංකා හමුදාවෝ විවෘත ලෙස 2002 සටන් විරාමය උල්ලංඝනය කරද්දී ද ජනතාවට බෝම්බ හෙලද්දී හා මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් කඩකරද්දී රාජපක්ෂ ආන්ඩුවට නොමඳව සහාය දැක්වූහ. වොෂින්ටනය ප්‍රධානකොටම බියට පත්ව ඇත්තේ කලාපය තුල සිය ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන්ට හරස්වෙමින් උතුරු ප්‍රදේශයේ මානව ව්‍යසනයක්, දිවයින මෙන්ම අසල්වැසි ඉන්දියාව ද අස්ථාවර කරනු ඇතැයි යන්න පිලිබඳව ය.

තමන්ගේ පැත්තෙන් එල්ටීටීඊය රාජපක්ෂගේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට" පිටුබලය දෙමින් හා ඇෆ්ගනිස්ථානයේ හා ඉරාකයේ තමන්ගේම සාපරාධී යුද්ධවල යෙදී සිටින්නාවූ එම අධිරාජ්‍යවාදී බලවතුන්ට ම නිරර්ථක ආයාචන නිකුත් කරමින් සිටියි. සඳුදා නිකුත් කල නිවේදනයක් මඟින් එල්ටීටීඊ "එක්සත් ජනපදය හා ජාත්‍යන්තර ප්‍රජාවේ අනෙකුත් සාමාජිකයන් ද සටන් විරාමයක් සඳහා කල කැඳවුමට" ශ්‍රී ලංකාවේ ආන්ඩුව ඇහුම්කන් දිය යුතු බව කියා සිටියේය.

මේ කිසිවක් නොතකා කටයුතු කිරීම සඳහා රාජපක්ෂ ආන්ඩුව පෙන්වන අධිෂ්ඨානය ශ්‍රී ලංකාවේ වැඩ කරන ජනතාවට තියුනු අනතුරු ඇඟවීමක් ගෙන එයි. මිලිටරි ජයග්‍රහනයකින් සිදුවන්නේ කොලඹ පාලක පැලැන්තියේ අතිශයින්ම ප්‍රතිගාමී කොටස්වල හස්තය ශක්තිමත් කිරීම පමනකි. සාමය හා සමෘද්ධිය ගෙනඒම කෙසේ වෙතත් එල්ටීටීඊයේ මිලිටරි ශක්තිය විනාශ කිරීම, කම්කරු පන්තිය මත නව වටයක ප්‍රහාරයක් සඳහා කරලිය සකස්කරනු ඇත. ගැඹුරුවන ආර්ථික අර්බුදයක් හමුවේ ආන්ඩුව, විසිපස් වසරක් පුරා ගොඩනඟන ලද දැවැන්ත මර්දනකාරී යාන්ත්‍රනය, සිය ජීවන තත්වයන් රැකගැනීමට උත්සුක වන කම්කරුවන්ට, ගොවීන්ට හා තරුනයන්ට එරෙහිව මුදාහැරීමට පසුබට නොවනු ඇත.

© www.wsws.org